## ඉතා වැදගත්

පොදු උපදෙස් පත්‍රිකා 01/2020

මගේ අංකය-දපස/සමු.සං/සං/18
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,ගාල්ල
2020.06. 17

දකුණු පළාතේ විවිධ සේවා සමුපකාර සමිති, ස.ණ.ස සමිති ඇතුළු සියළුම
සමුපකාර සමිතිවල ගරු සභාපතිවරුන්/ලේකම්වරුන් වෙත,

**<u>සමුපකාර සමිති මගින් ණය නිකුත් කිරීම/ ණය අය කර ගැනීම හා ණය ගෙවීම පැහැර හරින අවස්ථාවක ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග විධිමත් කිරීම සම්බන්ධව</u>**

දකුණු පළාත තුළ ලියාපදිංචි සමුපකාර සමිති මගින් ණය නිකුත් කිරීමේදී, නැවත ණය අය කර ගැනීමේදී හා ණය ගෙවීම පැහැර හරින අවස්ථාවක ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමේදී ඒ සඳහා නියමිත පටිපාටින් අනුගමනය කිරීම ප්‍රමාද වීම නිසා හෝ අනුගමනය නොකිරීම නිසා හෝ සමුපකාර සමිති මූල්‍ය දුෂ්කරතාවයන්ට මෙන්ම වෙනත් නෛතික ගැටළු වලට ලක් වන බව මා වෙත වාර්තා වී ඇත.

02. එබැවින් එම ක්‍රියාවලින් විධිමත් පටිපාටීන් අනුව සිදු කල යුතු අතර එහිදී පහත සඳහන් උපදෙස් අනුගමනය කරන ලෙස කාරුණිකව දන්වමි.

- සමුපකාර සමිති මගින් ණය ලබා දිය හැක්කේ තම සමිතියේ සාමාජිකයන්ට පමණක් වන අතර වෙනත් සමුපකාර සමිති සඳහා ණය ලබාදීමට තම අතුරු ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සලසා ගෙන ඇති සමිති, ඒ සඳහා නියමිත නෛතික පියවරවල් අනුගමනය කරමින් වෙනත් සමුපකාර සමිති සඳහා ණය ලබා දිය හැකිය.

- විවිධ සේවා සමුපකාර සමිති මගින් ණය ලබා දීම තම සමිතියේ අනුමත ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහයේ සඳහන් විධිවිධානයන් එහි සීමාවන් හා උපරිමයන්ට යටත්ව සිදු කල යුතු අතර, තම සමිතිය ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහයක් අනුමත කර නොමැති නම් හෝ අනුමත කර ඇති ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහය යාවත්කාලීන කර නොමැති නම් නියමිත ඉෙනතික ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් අනුමත කර ගැනීම හෝ යාවත්කාලීන කිරීමට අවශය පියවර කඩිනමින් ගත යුතුය.

- විවිධ සේවා සමුපකාර සමිති මගින් ණය නිකුත් කිරීමේදී ණය අනුමත කල හැකි නිලධාරීන් හා ඔවුන්ට අනුමත කල හැකි උපරිම ණය සීමාවන් හා අනුමත කිරීමේදී අනුගමනය කල යුතු ක්‍රියා පිළිවෙල ඔවුන් වෙත ලිඛිතව ලබාදී ඒ අනුව කටයුතු සිදු වන්නේදැයි අධ්‍යක්ෂ මණ්ඩලය/සාමාන්‍යාධිකාරී විසින් අධීක්ෂණය කල යුතුය. කෙසේ වුවද සමිතිය මගින් නිකුත් කරනු ලබන සෑම ණය මුදලක් සඳහාම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා ගත යුතුය.

- ස.ණ.ස සමිති මගින් ණය ලබා දීමේදී ණය ලබා දීමට ප්‍රථම සෑම ණයක්ම කාරක සභාව විසින් අනුමත කල යුතු අතර අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපරිම පුද්ගල ණය සීමාවට යටත්ව ණය ලබා දිය යුතු අතර, පුද්ගලික ණය ලබා දීමේදී පුද්ගල ඇප සීමාවට යටත්ව ණය ලබා දීම සිදු කල යුතුයි. කෙසේ වුවද සමිතිය සඳහා අනුමත කර ගෙන ඇති උපරිම පුද්ගල ණය සීමාව තුළ සිටිමින් එක් එක් සාමාජිකයා සඳහා උපරිම ණය සීමාවක් මහා සභාව විසින් නියම කල යුතු අතර ඒ සීමාවට යටත්ව පමණක් එම සාමාජිකයාට ණය ලබා දීම සිදු කල යුතුයි.

- ණය ලබා දීමට ප්‍රථම ණයකරුට ණය ගෙවීමේ හැකියාවක් පවතීද යන්න සම්බන්ධයෙන් විධිමත් පෙර විපරමක් සිදු කල යුතු අතර, ණයකරුගෙන් ලබා ගන්නා ආර්ථික තොරතුරු ප්‍රකාශය නිවැරදි බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව ණය නිකුත් කිරීමට කටයුතු කල යුතුයි. එහිදී ලබා දිය හැකි උපරිම ණය මුදල එකවර ලබා නොදිය යුතු අතර ක්‍රමිකව ණය් මුදලේ වටිනාකම වැඩිවන ආකාරයට ණය ලබා දීමට කටයුතු

කල යුතු වේ. තවද වටිනාකමින් වැඩි ණය මුදලක් ලබා දීමේදී ණයකරු පෙර ලබා ගත් ණය නියමිත පරිදි ගෙවා තිබේද යන්න පිළිබඳව දැඩි අවධානය යොමු කල යුතුවේ.

- දේපළ ඇප මත ණය ලබා දීමේදී දේපළ සම්බන්ධයෙන් පිළිගත් තක්සේරුවක් ලබා ගත යුතු අතර තක්සේරු වටිනාකමින් 50% ක උපරිම ප්‍රමාණයක් වන පරිදි ණය ලබා දිය හැකිය. නමුත් එහිදීද ණය ලබා ගැනීමට අවශ්‍ය වන අනෙකුත් නෛතික අවශ්‍යතාවයන් ණයකරු විසින් සම්පූර්ණ කර තිබිය යුතු අතර ආර්ථික තොරතුරු ප්‍රකාශය අනුව ණය ගෙවීමේ හැකියාව තිබෙන බවට කාරක සභාව සෑහීමකට පත් විය යුතුවේ. එහිදී අදාල දේපළ ණයකරුගේම දේපළක් බවට ඔප්පු හා හිමිකම් වාර්තා මගින් සනාථ කර ගත යුතු අතර ණයකරුගේ දේපළ සමිතිය නමට උකස් ඔප්පුවක් මගින් පැවරිය යුතු වේ. තවද උකස් ඔප්පුව නිසි පරිදි ලියාපදිංචි කිරීම කල යුතු අතර උකස්කරය පිළිගත් ක්‍රමවේදය අනුව පිළියෙල කල යුතුවේ.

- ණය නිකුත් කිරීමේදී ණයකරුගේ/ ඇපකරුවන්ගේ අවශ්‍ය වන සියළුම තොරතුරු ලබා ගත යුතු අතර එයට ඔවුන් පිළිබඳ විස්තර (නම, රැකියාව, හැඳුනුම්පත් අංකය), ඔවුන්ගේ සම්බන්ධීකරණ තොරතුරු (නිවසේ/කාර්යාලීය ලිපිනයන්, දුරකතන අංකයන්), ඔවුන්ගේ වත්කම් හා ණය වන විට ලබා ගෙන ඇති ණය පිළිබඳ විස්තර ඇතුළත් විය යුතුවේ. තවද අදාල තොරතුරු පිළිගත් ලේඛණයක් මගින් තහවුරු කර ගත යුතු අතර, තහවුරු ලේඛණ වල පිටපත් සහතික කර ලබා ගත යුතුය. මෙහිදී සෑම ණය නිකුත් කිරීමක් සඳහාම ණයකරුගේ, ඇපකරුවන්ගේ පිළිගත් වලංගු හැඳුනුම් පත්‍රයක සහතික පිටපතක් ලබා ගත යුතු අතර අදාල ණය ගොනුවේ ඒවා අමුණා තැබිය යුතුවේ.

- සෑම ණයක් සඳහාම පිළිගත් නිශ්චිත ආකෘති පත්‍රයක් අනුව පිළියෙල කරන ලද ණය ඉල්ලුම් පත්‍රයක්/ණය ගිවිසුමක්/ඇප ගිවිසුම් තිබිය යුතු අතර ඒවා නිසි පරිදි සම්පූර්ණ කර තිබිය යුතුවේ. ණය ගිවිසුම්/ඇප ගිවිසුම් පිළිගත් සාක්ෂිකරුවන් ඉදිරියේ අත්සන් කල යුතු අතර ණය නිකුත් කිරීමට ප්‍රථම ණය නිර්දේශ කිරීම, අනුමත කිරීම නිසි පරිදි සිදුවී ඇති බවට කලමණාකරු සෑහීමකට පත් විය යුතුවේ. එසේම ණය ලබා දීමේදී හැකි සෑම විටම ණයකරුගේ ඉතිරි කිරීමේ/ජංගම ගිණුමට ණය මුදල බැර කර යුතුවේ.

- සෑම විටම ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා ණය ලබා දීමට ප්‍රමුඛතාව ලබා දිය යුතු අතර ඉදිකිරීම් වැනි කාර්යක් සඳහා ණය නිකුත් කරන්නේ නම් අදියර කිහිපයක් යටතේ ණය නිකුත් කල යුතු අතර, මුල් අදියර යටතේ නිකුත් කරන ලද ණය මගින් ඉටු කරන ලද කාර්යය පිළිබඳ පසු විපරම් කර ඉතිරි ණය වාරික නිකුත් කල යුතුවේ.

- කළමණාකරුවන් තම බැංකු ශාඛාවෙන්/ සමිතියෙන් නිකුත් කරන ලද ණය මුදල් සම්න්ධයෙන් පසු විපරම් සිදු කිරීම මෙන්ම එම ණය මුදල් වලට අදාල වාරික අය විය යුතු දිනයන් පිළිබඳ වාර්තා පවත්වා ගෙන යායුතු වේ. තවද එම ණය වාරික නියමිත දිනට අය නොවන්නේ නම් දුරකතන පණිවුඩ/කෙටි පණිවුඩ/E-mail වැනි මාධ්‍යයක් මගින් ණයකරු දැනුවත් කල යුතුවේ. ණය වාරික ගෙවීම ප්‍රමාද කරනු ලබන අවස්ථාවල මාගේ චක්‍රලේඛ අංක 2016/01 හි සඳහන් පරිදි වාරික ගෙවීම පිළිබඳ සිහිකැඳවමින් ණයකරු/ඇපකරු වෙත ඒ ඒ දිනයන් අවසානයේ පළමු,දෙවන,තෙවන,හතරවන හා පස්වන සිහි කැඳවීම් ලිපි අවශ්‍ය වන පරිදි තැපැලෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් යොමු කල යුතුවේ.

- ණය වාරික ගෙවීම මාස 03 කට වඩා කල් පසු වන්නේ නම් වාරික ගෙවීම පිළිබඳ සිහිකැඳවමින් ණයකරු හා ඇපකරුවන් වෙත ලියාපදිංචි තැපැලෙන් සිහි කැඳවීම් ලිපි යොමු කල යුතු අතර ණය මුදල කල් පසු ණය ගණයට මාරු කල යුතුවේ. ඒ සඳහා අදාල සටහන් නිසි පරිදි පැනවිය යුතුය.

- තවදුරටත් ණය වාරික ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම් අවශ්‍ය කාරක සභා තීරණ නොපමාව ලබා ගැනීමෙන් අනතුරුව නිශ්චිත කාලයක් ලබා දී ණයකරු හා ඇපකරුවන් වෙත ලියාපදිංචි තැපැලෙන් එන්තරවාසි යොමු කල යුතුවේ.

- එයින් පසුවද ගෙවීම පැහැර හරින්නේ නම් අදාල ආරවුල තීරකකරණයට යොමු කල යුතු අතර ඒ සඳහා අවශ්‍ය වන ගොනුව අදාල සියළුම තීරණ/ලේඛණ ඇතුළත් කර නිවැරදිව සම්පූර්ණ කිරීමෙන් පසුව සමිතිය භාර සංවර්ධන නිලධාරීගේ නිර්දේශය සහිතව නියමිත ගාස්තුව ගෙවමින් දිස්ත්‍රික්කය භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත නොපමාව ඉදිරිපත් කල යුතුවේ.

- දිස්ත්‍රික්කය භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් විසින් අදාල ආරවුල බේරුම් කිරීම සඳහා බේරුම්කරුවෙකු/ බේරුම්කාර මණ්ඩලයක් පත් කල පසු ඔවුන්ගේ දැනුම්දීම් අනුව ආරවුල් විභාගය සඳහා සහභාගී වී බේරුම්කරුට/ බේරුම්කාර මණ්ඩලයට තම උපරිම සහයෝගය ලබා දී ආරවුල සම්බන්ධයෙන් තීන්දුවක්/තීරණයක් ලබා ගත යුතුවේ. එසේ තීන්දුවක්/තීරණයක් ලබා ගැනීමෙන් පසු ඒ සඳහා අදාල සටහන් නිසි පරිදි පැනවිය යුතුය.

- එයින් පසුවද ගෙවීම පැහැර හරින්නේ නම් තීන්දුව/තීරණය අධිකරණයේ බල ගැන්වීම සඳහා දිස්ත්‍රික්කය භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ඉල්ලීමක් වහාම ඉදිරිපත් කල යුතුවේ. එහිදීද ඒ සඳහා අදාල සටහන් නිසි පරිදි පැනවිය යුතුය.

- තීරක තීන්දුව උසාවි ගත කිරීමෙන් පසු ඇ/ආ ආකෘතිය පදනම් කර ගෙන ඒ සඳහා අදාල සටහන් නිසි පරිදි පැනවිය යුතු අතර දෙපාර්තමේන්තුව වෙනුවෙන් අධිකරණ කටයුතු සඳහා සහභාගී වන නිලධාරියාට අවශ්‍ය උපරිම සහයෝගය ලබා දිය යුතුය. ණය මුදල ගරු අධිකරණය මගින් වාරික වශයෙන් අය වීමෙන් අනතුරුව මාසිකව ඔබ වෙත ප්‍රේෂණය කරනු ලබන අතර එම මුදල් ලබා ගැනීමෙන් පසු ඒ සඳහා අදාල සටහන් නිසි පරිදි පැනවිය යුතුය.

- ණය මුදල හා පොළිය නියමිත පරිදි බැංකු ශාඛාවට/ සමිතියට ගෙවූ පසු හෝ ණය මුදල හා පොළිය සම්පූර්ණයෙන් ගරු අධිකරණය මගින් වාරික වශයෙන් අය කර ඔබ වෙත එවීමෙන් පසු ණයකරුගේ ඉල්ලීම පරිදි ණයකරුට ලබා දිය යුතු ඔප්පු/ලේඛණ/කොටස් මුදල් ආදිය ලබා දීමට කටයුතු කල යුතුය.

- ණය මුදලේ වටිනාකම රුපියල් ලක්ෂ 05 හෝ ඊට වඩා වැඩි වන විට, වැඩි ප්‍රතිලාභයක් අඩු පිරිවැයකින් ලබා ගත හැකි පිළිගත් සුදුසු රක්ෂණ ආයතනයක් මගින්, කාරක සභා තීරණ හා අවශ්‍ය අවස්ථාවන්හි මහා සභා තීරණ ලබා ගැනීමෙන් පසුව ණය මුදල රක්ෂණය කිරීමට කටයුතු කල යුතුය.

03. මෙම උපදෙස් පිළිබඳ ඔබගේ පුද්ගලික අවධානය යොමු කර කටයුතු කිරීම අත්‍යවශ්‍ය වන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්.ජී. කන්නන්ගර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

පිටපත්-

01. ලේකම්, කෘෂිකර්ම...සමුපකාර අමාත්‍යාංශය,ලබුදූව - කාරු.දැ. පි
02. සහකාර කොමසාරිස්-(ගාල්ල/මාතර/හම්බන්තොට) - කාරු.දැ.පි හා මෙම උපදෙස් අනුව කටයුතු සිදු වන බව අධීක්ෂණය කිරීම සඳහා
03. සියළුම සමුපකාර සංවර්ධන නිලධාරීන් - කාරු.දැ.පි හා සමිති සඳහා උපදෙස් ලබා දීමට හා මේ අනුව කටයුතු සිදු වන බව අධීක්ෂණය කිරීම සඳහා